DSL 2024/2025

NILIS

# පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in School Librarianship (පාඨමාලා කේතය: DSL)

**1) හැඳින්වීම**

වර්ෂ 1998 දී හඳුන්වා දෙන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව පුස්තකාලය, ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය හා පරිගණක විද්‍යාගාරය එක් ඒකකයක් ලෙස සලකමින් පාසල් පුස්තකාලය, පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ලෙස නම් කරන ලදි. ඒ අනුව තොරතුරු කුසලතා ඉගැන්වීම, සහභාගීත්ව ඉගැන්වීම හා ස්වාධීන ඉගනුමට පහසුකම් සැපයීම ගුරු/පාසල් පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය වන අතර, මෙමඟින් සම්පත් පාදක ඉගෙනුම හා සහභාගීත්ව ඉගෙනුම මූලික කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. මෙම ඩිප්ලෝමා පාඨමාලාවෙන් අපේක්ෂා කරනුයේ පාසල් පුස්තකාලය මගින් සිදු කෙරෙන උක්ත කාර්යයන් සඳහා සහාය දැක්විය හැකි වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමයි.

**2) ඉලක්ක කණ්ඩායම**

පාසල් පුස්තකාලවල සේවය කරන හෝ පාසල් පුස්තකාල කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම අයෙකු සඳහා.

**3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්**

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව විෂයන් 03 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම.)
  **හෝ**
- අ.පො.ස (සා.පෙ.) සමත්වීම <u>සහ</u> ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු **පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACSL) / හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.

**4) ඉගෙනුම් ඵල**

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු

- පාසල් පුස්තකාලයේ නව ප්‍රවණතා අවබෝධ කර ගැනීමට
- සම්පත් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පාසල් පුස්තකාලයේ දායකත්වය හඳුනාගැනීමට,
- අන්තර්ජාලය ඉගෙනුම් ඉගැන්වීම් මෙවලමක් ලෙස යොදා ගත හැකි ආකාරය වටහා ගැනීමට සහ
- තොරතුරු සාක්ෂරතා සහිත පුද්ගලයෙකු බවට පත්කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට හැකිවනු ඇත.

**5) පාඨමාලාවට අන්තර්ගත විෂයන්**

1. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ හැඳින්වීම
2. එකතු සංවර්ධනය සහ කළමනාකරණය
3. පුස්තකාල සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය
4. තොරතුරු සම්පත් හා සේවා
5. ව්‍යාපෘති වාර්තා සම්පාදනය
6. තොරතුරු සාක්ෂරතාව
7. සක්‍රීය කියවීම ඉගැන්වීම
8. ළමා සහ යොවුන් සාහිත්‍යය

6. **පාඨමාලාවේ වැදගත්කම:** DSL පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




7. **පාඨමාලා කාලය :** මාස 12
8. **මාධ්‍ය :** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).
9. **පන්ති පැවැත්වීම :** දේශන වැඩි ප්‍රමාණයක් මාර්ගගතව පැවැත්වේ.
10. **ඇගයීම් ක්‍රමවේදය :** පැවරුම්, අධ්‍යයන වාරයේ අවසානයේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණය සහ ව්‍යාපෘති වාර්තාවක් මගින් සිසුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ.
11. **පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම් : පාසල් පුස්තකාලයාධිපතිත්ව** ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම් සෑම විෂයයකට අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.
12. **පාඨමාලා ගාස්තු : සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 29000/= කි.** (වාරික දෙකකින් ගෙවිය හැක)
13. **වැඩසටහන් ආරම්භය:** 2024 ඔක්තොම්බර්

14. **අයදුම් කරන ආකාරය**

I. අපගේ වෙබ් අඩවියෙන් (nilis.cmb.ac.lk) අයදුම්පත බාගත කරන්න.
II. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න.
III. උප්පැන්න සහතිකයේ, උ.පෙළ සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් අමුණන්න
IV. මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් සැකසීමේ ගාස්තුව ලෙස රු.300.00 ගෙවා, රිසිට් පත අයදුම්පතෙහි අදාළ කොටුවේ අලවන්න.
V. **නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2024 ඔක්තොම්බර් 25 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට තැපැල් කරන්න.**


“ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03”
දුරකථන: 011 2507150 / 0701478619